සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

21 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2004 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2004 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2004

ආර්ථික විද්‍යාව II (I කොටස)
பொருளியல் II (பகுதி I)
Economics II (Part I)

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

විභාග අංකය : ....

<u>සැලකිය යුතුයි</u> :

- ✳ මෙම කොටසේ ප්‍රශ්න 20 ක් ඇත. ඒ සියලු ප්‍රශ්න අනිවාර්ය වේ.
- ✳ එක් ප්‍රශ්නයකට ලකුණු 02 ක් ලැබෙන අතර, මුළු කොටසට ලකුණු 40 ක් හිමි වේ.
- ✳ එක් බහුවරණ ප්‍රශ්නයකට ඇත්තේ එක් නිවැරදි පිළිතුරක් පමණි. එම පිළිතුර හඳුනාගෙන පිළිතුරට යටින් ඉරක් අඳින්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතුයි.
- ✳ නියමිත කාලය අවසන් වූ විට I හා II කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා ශාලාධිපතිට භාර දිය යුතුයි.

---

1. මුදල් නොවන ද්‍රව්‍යමය වත්කමක් වඩාත් ද්‍රවශීල යැයි සලකනුයේ,
   (i) එම වත්කමෙහි පරිණත කාලය දීර්ඝ වේ නම් ය.
   (ii) රාජ්‍ය නොවන ප්‍රධාන සමාගමක් විසින් එම වත්කම නිකුත්කොට තිබේ නම් ය
   (iii) එම වත්කම ඉහළ පොලී අනුපාතිකයක් උපයන්නේ නම් ය.
   (iv) එකකට වඩා වැඩි භාවිත සංඛ්‍යාවක් එම වත්කමට තිබේ නම් ය.
   (v) එම වත්කම ඉතා ඉක්මනින් සහ වැඩි වියදමකින් තොරව මුදල්වලට පරිවර්තනය කර ගත හැකි නම් ය.

2. එක්තරා වාණිජ බැංකුවක් සතුව රුපියල් මිලියන 250 ක මුළු තැන්පතු ප්‍රමාණයක් සහ රුපියල් මිලියන 170 ක මුළු සංචිත ප්‍රමාණයක් ඇතැයි සලකන්න. අනෙකුත් වත්කම් සමන්විතව ඇත්තේ මුදල්වලිනි. අවශ්‍ය සංචිත අනුපාතය 10% ක් වේ නම් දැනට මෙම බැංකුව සතුව ඇති අධි සංචිත ප්‍රමාණය කොපමණ ද?
   (i) රුපියල් මිලියන 800 කි.
   (ii) රුපියල් මිලියන 145 කි.
   (iii) රුපියල් මිලියන 129 කි.
   (iv) රුපියල් මිලියන 25 කි.
   (v) රුපියල් මිලියන 17 කි.

3. මහ බැංකුව විසින් ගනු ලබන පහත සඳහන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අතුරෙන් මුදල් සැපයුමෙහි වැඩිවීමකට තුඩුදිය හැකි ක්‍රියාමාර්ගය කුමක් ද?
   (i) රජයේ සුරැකුම්පත් අලෙවි කිරීම.
   (ii) සංචිත අවශ්‍යතා පහළ හෙළීම.
   (iii) වට්ටම් අනුපාතිකය ඉහළ නැංවීම.
   (iv) ඉහත සඳහන් සියල්ල ම.
   (v) ඉහත සඳහන් කිසිවක් නොවේ.

4. මුදල් ප්‍රමාණවාදී න්‍යායට අනුව මුදල් සැපයුමෙහි වැඩිවීමක්,
   (i) මිලෙහි සමානුපාතික වැඩිවීමක් ඇති කරයි.
   (ii) මුදලේ සංසරණ ප්‍රවේගයෙහි සමානුපාතික වැඩිවීමක් ඇති කරයි.
   (iii) මූර්ත නිමැවුමෙහි සමානුපාතික වැඩිවීමක් ඇති කරයි.
   (iv) මිල ගණන් හා මූර්ත නිමැවුම යන දෙක ම සමානුපාතිකව වැඩිවීමට බලපායි.
   (v) සංසරණ ප්‍රවේගය සහ මිල ගණන් යන දෙක ම සමානුපාතිකව වැඩිවීමට බලපායි.

[දෙවැනි පිටුව බලන්න.

www.pastpaperlk.com
www.artsapi.lk

5. මූර්ත පොලී අනුපාතිකය ධන අගයක් ගනී නම්,
   (i) උද්ධමන අනුපාතිකයට වඩා නාමික පොලී අනුපාතිකය වැඩි විය යුතු ය.
   (ii) මූර්ත රාජ්‍ය ණය බර පහළ වැටෙනු ඇත.
   (iii) උද්ධමන අනුපාතිකයට වඩා නාමික පොලී අනුපාතිකය අඩුවිය යුතු ය.
   (iv) පෞද්ගලික ඉතුරුම්වල මූර්ත වටිනාකම පහළ වැටෙනු ඇත.
   (v) උද්ධමන අනුපාතිකය ඉහළ යාමට බලපානු ඇත.

6. උද්ධමනය අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතීම ආර්ථික වෘද්ධියට බලපායි. මක්නිසාදයත්,
   (i) ඉහළ මිල ගණන් පෙළඹීමක් කරන නිසා ආර්ථිකය පුරා ආයෝජනය වැඩි වීමෙන් වෘද්ධි අනුපාතිකය ඉහළ යන බැවිනි.
   (ii) වැඩිපුර ණය ගැනීම ධෛර්යමත් කිරීම මගින් ආර්ථික වෘද්ධිය ඉහළ යන බැවිනි.
   (iii) ආයෝජකයන්ගේ විශ්වසනීයත්වය වැඩිවීම තුළින් ආර්ථික වෘද්ධිය ඉහළ යන බැවිනි.
   (iv) අනාගත ලාභ පිළිබඳ අවිනිශ්චිතතාව වැඩි කිරීම තුළින් ආර්ථික වෘද්ධිය පහත වැටෙන බැවිනි.
   (v) උද්ධමන අනුපාතිකයට සමානුපාතිකව හෝ ඊට වැඩි වේගයකින් හෝ අගය ඉහළ යන මූර්ත දේපොළ සහ රත්රන් වැනි වත්කම්වල වැඩියෙන් ආයෝජනය කිරීමට පෙලඹෙන බැවිනි.

7. සේවා නියුක්ත ජනගහනය මිලියන 40 ක් ද, සේවා වියුක්ත ජනගහනය මිලියන 10 ක් ද, වැඩ කරන වයසේ ජනගහනය මිලියන 70 ක් ද, වැඩ කිරීමට කැමැත්තක් නොදක්වන ජනගහනය මිලියන 20 ක් ද වේ නම් විරැකියා අනුපාතිකය වනුයේ,
   (i) 25·0 % කි.
   (ii) 20·0 % කි.
   (iii) 15·7 % කි.
   (iv) 14·3 % කි.
   (v) 11·1 % කි.

8. පහත සඳහන් සාධක අතුරෙන් ආර්ථික වෘද්ධියට බලපාන සාධකය කුමක් ද?
   (i) ශුද්ධ බාහිර සංක්‍රමණ වැඩිවීම
   (ii) සාධක ඵලදායිතාව ඉහළ යාම
   (iii) සංක්‍රාම ගෙවීම් වැඩිවීම
   (iv) පොලී අනුපාතිකය වැඩිවීම
   (v) මුදල් සැපයුම වැඩිවීම

9. පහත සඳහන් දෑ අතුරෙන් පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනයට බලපාන සාධකය කුමක් ද?
   (i) අපනයන සඳහා ඉල්ලුම වැඩිවීම
   (ii) වෘත්තීය සමිතිවල සටන්කාමීත්වය වැඩි කිරීම තුළින් ඉහළ වැටුප් දිහා යෑනීම
   (iii) බැංකු ණය වැඩිවීම
   (iv) රාජ්‍ය අංශය ලබා ගන්නා ණය වැඩිවීම
   (v) ගෙවුම් ශේෂ අතිරික්තය වැඩිවීම

10. මිල ස්ථායිතාව ඇතිවනුයේ,
   (i) ආර්ථිකයේ සියලු ම මිල ගණන් ස්ථාවර ව පවතින විට දී ය.
   (ii) උද්ධමනය ශූන්‍ය අගයක් ගන්නා විට දී ය.
   (iii) උද්ධමන අනුපාතිකය ස්ථාවර ව පවතින විට දී ය.
   (iv) ස්ථාවර වේගයකින් සාමාන්‍ය මිල මට්ටම ඉහළ යන විට දී ය.
   (v) මූර්ත ඒක පුද්ගල ආදායම් මට්ටම ස්ථාවර ව පවතින විට දී ය.

[පැත්වෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com www.artsapi.lk

11. ජාත්‍යන්තර වෙළෙඳම් ක්ෂේත්‍රය තුළ 'ප්‍රපාතනය' (dumping) යන සංකල්පයෙන් අදහස් වන්නේ,
   (i) සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වන රටවල් කරා ගුණාත්මක භාවයෙන් අඩු භාණ්ඩ අපනයනය කිරීමයි.
   (ii) අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි අත්කර ගැනීමයි.
   (iii) සාමාන්‍ය නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලට භාණ්ඩ අපනයනය කිරීමයි.
   (iv) රටවල නීතිමය මුහුදු සීමාවන්ගෙන් පිටත ජාත්‍යන්තර මුහුදු දූෂණය කිරීමයි.
   (v) අතිරික්ත නිෂ්පාදනය විනාශ කිරීමයි.

12. කිසියම් රටක අපනයන මිල ඉල්ලුම් නම්‍යතාව $-0{\cdot}7$ ක් ද ආනයන මිල ඉල්ලුම් නම්‍යතාව $-0{\cdot}8$ ක් ද වේ නම් එරට මුදල් ඒකකයේ බාහිර වටිනාකම ක්ෂය වුවහොත්,
   (i) ආනයන පරිමාවේ වැඩිවීමක් සිදුවේ.
   (ii) අපනයන පරිමාවේ අඩුවීමක් හටගනී.
   (iii) වෙළෙඳ අනුපාතයේ දියුණුවක් හටගනී.
   (iv) ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමට අයහපත් බලපෑමක් ඇති වේ.
   (v) ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමට යහපත් බලපෑමක් ඇති වේ.

13. යම් දෙනලද කාල පරිච්ඡේදයක් තුළ අපනයන මිල 20 % කින් ඉහළ ගොස් වෙළෙඳ අනුපාතය 25 % කින් අයහපත් වූයේ නම්, ආනයන මිල,
   (i) 16 % කින් වැඩිවිය යුතු ය.
   (ii) 20 % කින් වැඩිවිය යුතු ය.
   (iii) 25 % කින් වැඩිවිය යුතු ය.
   (iv) 40 % කින් වැඩිවිය යුතු ය.
   (v) 60 % කින් වැඩිවිය යුතු ය.

14. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතුවල යෙදී සිටින විදේශීය සමාගම් තම විදේශීය කොටස් හිමියන්ට ලාභාංශ ගෙවන විට එම ගනුදෙනුව ශ්‍රී ලංකා ගෙවුම් ශේෂ ලේඛනයෙහි සටහන් කරනුයේ,
   (i) වර්තන ගිණුමෙහි ශුද්ධ වර්තන සංක්‍රාම ගිණුම තුළ ය.
   (ii) වර්තන ගිණුමේ ශුද්ධ ආදායම් ගිණුම තුළ ය.
   (iii) වර්තන ගිණුමේ ශුද්ධ සේවා ගිණුම තුළ ය.
   (iv) ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුමේ ප්‍රාග්ධන සංක්‍රාම ගිණුම තුළ ය.
   (v) ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුමේ සෘජු විදේශීය ආයෝජන ගිණුම තුළ ය.

15. ලෝක වෙළෙඳ සංවිධානයේ ප්‍රධාන අරමුණක් වනුයේ,
   (i) ගෙවුම් ශේෂ දුෂ්කරතාවන්ට මුහුණපාන රටවල් සඳහා කෙටි කාලීන ණය පහසුකම් සැපයීමයි.
   (ii) සංවර්ධනය වන රටවලට මූල්‍යාධාර සහ උපදේශනය සැපයීමයි.
   (iii) ලෝක වෙළෙඳම් සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග ලිහිල් කිරීමයි.
   (iv) විදේශ විනිමය අනුපාතිකයන්හි පැසිරීම පිළිබඳ ක්‍රමවේදයක් ඇති කිරීමයි.
   (v) ලෝක වෙළෙඳම සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග වැඩි කිරීමයි.

16. කිසියම් රටක ඒක පුද්ගල මූර්ත ආදායම සහන වැටීමට පහත සඳහන් කාරණා අතුරෙන් කවරක් හේතු වේ ද?
   (i) ඉහළ ජනගහන වර්ධන වේගයක් සමග ඊටත් වඩා වැඩි වේගයකින් ප්‍රාග්ධන තොගය වර්ධනය වීම
   (ii) ඉහළ ජනගහන වර්ධන වේගයක් සමග ප්‍රාග්ධන තොගය නොවෙනස් ව පැවතීම
   (iii) ප්‍රාග්ධන තොගය සහ ශිල්පීය ඥානය ඉතා ඉහළ වේගයකින් වර්ධනය වීම
   (iv) අඩු ජනගහන වර්ධන වේගයක් සමග තාක්ෂණික වෙනස්වීම් ඉහළ වේගයකින් වර්ධනය වීම
   (v) අඩු ජනගහන වර්ධන වේගයක් සමග ප්‍රාග්ධන තොගය වර්ධනය වීම

17. රටක යැපුම් අනුපාතය අඩුවීමට පහත සඳහන් දෑ අතුරෙන් කුමක් බලපායි ද?
   (i) සේවා නියුක්ත ජනගහනයේ අඩුවීමක්
   (ii) විභව ශ්‍රම බලකායේ වැඩිවීමක්
   (iii) උපත් ප්‍රමාණයේ වැඩිවීමක්
   (iv) සේවා වියුක්ත ජනගහනයේ අඩුවීමක්
   (v) වැඩිහිටි ජනගහනයේ වැඩිවීමක්

[හතරවෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com
www.artsapi.lk

18. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
   (i) ආයු අපේක්ෂාව, අධ්‍යාපනය වැනි පුළුල් දර්ශක පද්ධතියක් මගින් ආර්ථික සංවර්ධනය මනිනු ලැබේ.
   (ii) ආර්ථික වෘද්ධිය යනුවෙන් අදහස් වනුයේ කිසියම් රටක භාණ්ඩ හා සේවා නිමැවුමේ අඛණ්ඩ වැඩිවීමකි.
   (iii) ඒක පුද්ගල ආදායම, ඒක පුද්ගල විදුලිය හා බලශක්ති පරිභෝජනය, වැනි දර්ශක භාවිතා කොට ජීවන තත්ත්වය මනිනු ලැබේ.
   (iv) ආර්ථිකය වර්ධනය වනවිට රට තුළ වාසය කරන සියලු දෙනාට ම, වඩා යහපත් ජීවන තත්ත්වයක් උදා වේ.
   (v) මූර්ත ජාතික ආදායම ස්ථාවරව තිබිය දී ජනගහනය වැඩි වන විට සාමාන්‍යයෙන් ජනතාව පෙරට වඩා දුප්පත් වේ.

19. 2002 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා යන අංශයන්හි සේවා නියුක්ති ප්‍රතිශත පිළිවෙළින්,
   (i) 48 %, 24 %, හා 28 % කි.
   (ii) 20 %, 25 %, හා 55 % කි.
   (iii) 24 %, 32 %, හා 44 % කි.
   (iv) 33 %, 21 %, හා 46 % කි.
   (v) 31 %, 29 %, හා 40 % කි.

20. මානව සංවර්ධන දර්ශකය අනුව ඉහළ ම තලයේ සිටින රටවල් පහ කවරේ ද?
   (i) නෝර්වේ, බෙල්ජියම, ස්වීඩනය, ෆින්ලන්තය, ලක්ෂෙම්බර්ග්
   (ii) නෝර්වේ, අයිස්ලන්තය, ස්වීඩනය, ඔස්ට්‍රේලියාව, නෙදර්ලන්තය
   (iii) නෝර්වේ, ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, ස්විට්සර්ලන්තය
   (iv) නෝර්වේ, කැනඩාව, ජපානය, ෆින්ලන්තය, ස්වීඩනය
   (v) නෝර්වේ, ඔස්ට්‍රේලියාව, අයර්ලන්තය, නෙදර්ලන්තය, බෙල්ජියම

* *

www.pastpaperlk.com
www.artsapi.lk

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2004 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2004 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2004

ආර්ථික විද්‍යාව II (II කොටස)
பொருளியல் II (பகுதி II)
Economics II (Part II)

පැ දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

* 'අ' උප කොටසින් ප්‍රශ්න දෙකක් ද,
'ආ' උප කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

'අ' උප කොටස

(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

1. (i) 2002 වර්ෂයේ දී සංශෝධනය කරන ලද මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු කවරේ ද? (ලකුණු 02 යි.)
   (ii) මුදල්, ආසන්න මුදල් සහ මුදල් ආදේශක අතර වෙනස දක්වන්න. (ලකුණු 03 යි.)
   (iii) මුදල් පදනම සහ මුදල් සැපයුම අතර වෙනස කුමක් ද? (ලකුණු 04 යි.)
   (iv) මහජනයා මුදල් ඉල්ලුම් කරන්නේ ඇයි? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

2. (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන ප්‍රධාන මූල්‍ය අතරමැදි ආයතන වර්ග මොනවා ද? (ලකුණු 04 යි.)
   (ii) කිසියම් කල්පිත ආර්ථිකයක වාණිජ බැංකු පද්ධතිය තුළ කටයුතු කරන එක් වාණිජ බැංකුවක ශේෂ පත්‍රය පහත දක්වේ.
   (සංඛ්‍යා රුපියල් මිලියන වලිනි.)

වත්කම්		වගකීම්	
ඉල්ලුම් තැන්පතු	200 000	සංචිත	50 000
කොටස්කරුවන්ගේ ප්‍රාග්ධනය	50 000	සුරැකුම්පත්	55 000
		ණය	145 000
	250 000		250 000

   ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් නම්, මෙම බැංකුව සතුව අධි සංචිත තිබේ ද? එසේනම් එය කොපමණ ද? (ලකුණු 02 යි.)
   (iii) මෙම බැංකුවට සැපයිය හැකි උපරිම ණය ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02 යි.)
   (iv) බැංකුවට සැපයිය හැකි උපරිම ණය ප්‍රමාණය ලබාදුනහොත් බැංකුවේ ශේෂ පත්‍රය වෙනස්වන්නේ කෙසේ දැයි පෙන්වන්න. (ලකුණු 03 යි.)
   (v) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20 % ක් වුවහොත් මෙම බැංකුවට අතිරේක ණය දීමට හැකියාවක් තිබේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

3. (i) "ලෝක ආර්ථිකය තුළ වෙළෙඳ හවුල් (Trading blocks) වල වැදගත්කම වැඩිවෙමින් පවතී." වෙළෙඳ හවුලකට සම්බන්ධවීමෙන් සාමාජික රටකට ලබාගත හැකි ප්‍රතිලාභ කවරේ ද? (ලකුණු 03 යි.)
   (ii) ශ්‍රී ලංකාවේ දත්ත භාවිත කරමින් 1977 න් පසු අපනයන ව්‍යුහයෙහි ඇති වූ ප්‍රධාන වෙනස්කම් පරීක්ෂා කරන්න. (ලකුණු 04 යි.)
   (iii) "මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ තරගකාරීත්වය පහත බැස ඇත." ශ්‍රී ලාංකීය භාණ්ඩවල ජාත්‍යන්තර තරගකාරීත්වය පිරිහීමට බලපා ඇති සාධක කවරේ ද? (ලකුණු 04 යි.)
   (iv) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර තරගකාරිත්වය ඉහළ නැංවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කවරේ ද?. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

4. (i) මූර්ත විනිමය අනුපාතිකය යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02 යි.)

(ii) රටක ශුද්ධ අපනයන ප්‍රමාණය වැඩිවීමට ඉවහල්වන ආකාරයට මූර්ත විනිමය අනුපාතිකය වෙනස්වීමට බලපාන හේතු කවරේ ද? (ලකුණු 04 යි.)

(iii) චල (පාවෙන) විනිමය අනුපාතික ක්‍රමයට එරෙහිව ඉදිරිපත් කළ හැකි තර්ක කවරේ ද? (ලකුණු 04 යි.)

(iv) රුපියලෙහි බාහිර වටිනාකම ක්ෂයවීම නිසා ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇතිවිය හැකි ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 05 යි.)

'ආ' උප කොටස

(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

5. (i) 'සමාජ ප්‍රාග්ධනය' (social capital) යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 03 යි.)

(ii) "ආර්ථික වෘද්ධිය සඳහා ඉහළ මට්ටමක ඉතුරුම් අවශ්‍ය වන නමුදු එය ප්‍රමාණවත් පූර්ව කොන්දේසියක් නොවේ." ඔබ එකඟවන්නෙහි ද? හේතු දක්වන්න. (ලකුණු 04 යි.)

(iii) සංවර්ධනය වන රටක වෘද්ධි අනුපාතිකය ඉහළ දැමීම සඳහා රජයට ගත හැකි ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 04 යි.)

(iv) වෘද්ධිය සහ සංවර්ධනය අතර පවත්නා වෙනස කුමක් ද? (ලකුණු 04 යි.)

6. (i) ශ්‍රී ලංකාවේ ශ්‍රම හමුදා සහභාගිත්ව (ක්‍රියාකාරී) අනුපාතිකය ගණනය කරන්නේ කෙසේ ද? (ලකුණු 03 යි.)

(ii) ශ්‍රී ලංකාවේ උගත් තරුණ පිරිස අතර ඉහළ සේවා වියුක්ති අනුපාතිකයක් පැවතීමට බලපාන හේතු කවරේ ද? (ලකුණු 03 යි.)

(iii) ශ්‍රී ලංකාවේ ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීමට ඔබට යෝජනා කළ හැකි ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 04 යි.)

(iv) ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳ පොළේ නම්‍යශීලීභාවය වැඩි කිරීමට රජය මෑත වර්ෂවල දී ගත් ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 05 යි.)

7. (i) නිරපේක්ෂ දරිද්‍රතාව සහ සාපේක්ෂ දරිද්‍රතාව යන සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(ii) සංවර්ධනය වන රටවල දිළිඳු ජනතාවට ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ ප්‍රමාණවත් පරිදි නොලැබීමට බලපාන හේතු මොනවා ද? (ලකුණු 05 යි.)

(iii) ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ උපායමාර්ගයක් ලෙස සමෘද්ධි වැඩසටහනෙහි දක්නට ලැබෙන ප්‍රධාන දුර්වලතා කවරේ ද? (ලකුණු 06 යි.)

8. (i) ව්‍යුහමය ගැළපුම් ප්‍රතිපත්ති යනුවෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 04 යි.)

(ii) ආර්ථික වෘද්ධිය සහ මානව සංවර්ධනය කෙරෙහි ව්‍යුහමය ගැළපුම් ප්‍රතිපත්ති කෙබඳු ප්‍රතිවිපාක ඇති කෙළේ ද? (ලකුණු 05 යි.)

(iii) 2002 වර්ෂයේ ජුනි මස කොළඹ දී පැවති ශ්‍රී ලංකාවට ආධාර සපයන්නන්ගේ සමුළුවේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව වෙත ශ්‍රී ලංකා රජය විසින් 'දිළිඳුකම අඩුකිරීමේ උපායමාර්ගික පත්‍රිකාවක්' ඉදිරිපත් කරන ලදී. මෙම උපාය මාර්ගික පත්‍රිකාවෙන් රජය විසින් යෝජනා කර ඇති ප්‍රධාන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හතක් සඳහන් කරන්න. (ලකුණු 06 යි.)

* * *

www.pastpaperlk.com
www.artsapi.lk

ආර්ථික විද්‍යාව II - පැ දෙකයි.

Economics II - Two hours

II කොටස

"අ" උප කොටසින් ප්‍රශ්න දෙකක් ද, "ආ" උප කොටසින් ප්‍රශ්න දෙකක් ද, තෝරා ගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

"අ" උප කොටස

(මේ කොටසින් ප්‍රශ්න දෙකක්, තෝරා ගන්න.)

1. (i) "මුදල් සඳහා ඉල්ලුම පොලී අනුපාතිකය අනුව වෙනස් වේ." රූප සටහනක් ඇසුරෙන් මේ ප්‍රකාශය පැහැදිලි කරන්න.
   (ii) "මහ බැංකුව අවසාන ණය සපයන්නා වෙයි." මෙය පැහැදිලි කරන්න.
   (iii) මුදල් සැපයුමේ වර්ධනය සීමා කිරීම හෝ මුදල් සැපයුම අඩු කිරීම සඳහා මහ බැංකුවක් මැදිහත් වන ආකාරය පැහැදිලි කරන්න. (එක් කොටසකට ලකුණු 05 යි.)

2. (i) උද්ධමනයක් යනු කවරේ ද? ශ්‍රී ලංකාවේ උද්ධමනයක් මැන දක්වෙන දර්ශක මොනවා ද?
   (ii) 1996 සිට ශ්‍රී ලංකාවේ පැවැති උද්ධමනයේ ආකාරය සහ ප්‍රමාණය සැකෙවින් විමසන්න.
   (iii) ඉහළ මට්ටමක උද්ධමනයක් මඟින් ආර්ථිකයක් මත අහිතකර ප්‍රතිවිපාක බිහි කෙරේ යැයි බොහෝ විට පැවසෙන්නේ මන්ද? (එක් කොටසකට ලකුණු 05 යි.)

3. (i) රටක විදේශ වෙළෙඳ අනුපාතය පිරිහීමක් සිදු කළ හැකි සාධක කවරේ ද? එවැනි සිදුවීමක ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද?
   (ii) රටක ගෙවුම් ශේෂයේ වර්තන ගිණුම, එරට ජාතික ගිණුම් හා පවත්නා සම්බන්ධතාව පැහැදිලි කරන්න.
   (iii) රටක විදේශ විනිමය සංචිතවල සීඝ්‍ර අඩුවීමක ආර්ථික ප්‍රතිවිපාක මොනවා ද? (එක් කොටසකට ලකුණු 05 යි.)

4. (i) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ආනයන ව්‍යුහය සැකෙවින් විස්තර කර, 1977 ආර්ථික ලිහිල් කරණයෙන් පසු ආනයන ව්‍යුහයේ කෙබඳු වෙනස්වීම් සිදුවූයේ දයි දක්වන්න.
   (ii) 1998 දෙසැම්බර් මාසයේ දී රටවල් දෙක විසින් අත්සන් කරන ලද ඉන්දු-ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි අඩංගු ප්‍රධාන කරුණු මොනවා දයි සැකෙවින් විස්තර කරන්න.
   (iii) දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා විදේශ වෙළෙඳාම සීමා කිරීමේ අවශ්‍යතාව පිළිබඳ තර්ක ඉදිරිපත් කරන්න. (එක් කොටසකට ලකුණු 05 යි.)

"ආ" උප කොටස

(මේ කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

5. (i) ශ්‍රම බලකාය යනුවෙන් කුමක් අදහස් වේ ද? ශ්‍රී ලංකාවේ එය ගණන් බලන්නේ කෙසේ ද? මෑත වර්ෂවල එහි ඇස්තමේන්තුගත අගය කොපමණ වී ද?
   (ii) මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතිකය පහත බැසීමක් වාර්තා කර ඇති නමුදු ඌන සේවා නියුක්තිය වැදගත් ප්‍රශ්නයක් වශයෙන් දිගට ම පවතී. ඌන සේවා නියුක්තිය යනු කවරේ ද? එහි ආර්ථික ප්‍රතිවිපාක සැකෙවින් දක්වන්න.
   (iii) ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය විමසීමේ දී දක්නට ලැබෙන කරුණක් නම් සේවා වියුක්ති අනුපාතිකය අධ්‍යාපන මට්ටම සමඟ වැඩි වන බවයි. ඉහළ ම සේවා වියුක්ති අනුපාතිකය වන 17%-19% පවතින්නේ අ.පො.ස.(උ.පෙළ) හා ඊට ඉහළ සුදුසුකම් ලැබූවන් අතර ය. මේ කරුණු වලින් ඔබ ලබාගන්නා නිගමන කවරේ ද? (එක් කොටසකට ලකුණු 05 යි.)

6. (i) "ආර්ථික වර්ධන ක්‍රියාවලියෙහි දී සමස්ත ආර්ථිකය තුළ කෘෂි අංශයේ සාපේක්ෂ වැදගත්කම හීන වන අතර, ආර්ථිකයේ වැදගත් ම අංශය වශයෙන් ඉස්මතු වන්නේ සේවා කටයුතු යි." මේ ව්‍යුහමය වෙනස්වීමට ඔබ ඉදිරිපත් කරන හේතු කවරේ ද? (ලකුණු 05 යි.)
   (ii) "සංවර්ධනයේ මූලික දර්ශකය, වශයෙන් බොහෝ විට සැලකෙන්නේ සීඝ්‍ර ආර්ථික වර්ධනය යි. වර්ධනයේ ගුණාත්මක බව එතරම් අවධානයට යොමු වී නැත." මේ ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස් දක්වා, සංවර්ධන සංකල්පය හා එහි දර්ශක වැඩි දියුණු කර ගැනීම සඳහා ගෙන ඇති මෑත කාලීන උත්සාහයන් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

7. (i) කිසියම් වර්ෂයක් තුළ ශ්‍රී ලංකා ආර්ථිකයේ විදේශ වෙළෙඳාම හා මූල්‍ය අංශයේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් සකස් කරන ලෙස ඔබට දන්වා ඇත. ඔබ විසින් එවැනි වාර්තාවක ඇතුළත් කරනු ලබන ප්‍රධාන දර්ශක කවරේ ද? (ලකුණු 10 යි.)
   (ii) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් හෙළි වන මෙරට ආර්ථිකයේ ව්‍යුහය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

8. (i) "ශ්‍රී ලංකාවේ දුප්පත්කම පිළිබඳ පවත්නා විවිධ මිනුම් අනුව ජනගහනයෙන් සියයට 20 සිට සියයට 40 දක්වා ප්‍රමාණයක් දුප්පත්කමින් පෙළේ." දුප්පත්කම මැනීම සඳහා බහුල වශයෙන් භාවිත වන ප්‍රධාන ක්‍රම සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)
   (ii) දුප්පත්කම අඩුකරලීම සඳහා යොදා ගත හැකි ක්‍රමයක් වශයෙන් ක්ෂුද්‍ර මූල්‍යය (Micro Finance) පිළිබඳ කෙටි සටහනක් ලියන්න. (ලකුණු 05 යි.)

www.pastpaperlk.com
www.artsapi.lk